SAR/MGT
Please arrange students


# කොළඹ විශ්වවිද්‍යාලයීය - විද්‍යාර්ථීන්ගේ සංවිධානය
கொழும்பு பல்கலைக்கழக - முன்னாள் மாணவர்களின் சங்கம்
ALUMNI ORGANIZATION - UNIVERSITY OF COLOMBO

No: 181, Galle Road, Ratmalana, Sri Lanka. E-mail: uocalumniorg@gmail.com


2026.03.16

පීඨාධිපති
කළමනාකරන පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය

OFFICE OF THE DEAN
20 APR 2026
FACULTY OF MANAGEMENT

Mr. Thilina

මහත්මයාණෙනි/මහත්මියනි,

## පළස අන්තර් විශ්වවිද්‍යාල කවි,කෙටිකථා,කෙටිනාට්‍ය තරගාවලිය 2026

කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සංවිධානය කොළඹ විශ්වවිද්‍යාලයෙන් බිහි වූ විද්‍යාර්ථීන්ගෙන් සුසැදි සංවිධානයකි.

උසස් අධ්‍යාපනයේ නිරත විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ නිර්මාණාත්මක හා පරිකල්පන කුසලතා ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් සිව්වන වරටත් "පළස" කවි, කෙටි කතා, කෙටිනාට්‍ය තරගාවලිය පවත්වනු ලැබේ.

මෙම තරගාවලියට රාජ්‍ය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය ලත් පෞද්ගලික විශ්වවිද්‍යාල වල සිසුන්ට නිර්මාණ ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

නිර්මාණ එවිය යුතු ලිපිනය : **පළස සාහිත්‍ය තරගාවලිය 2026, කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සංවිධානය, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක කාර්යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03.**
**නිර්මාණ බාරගැනීමේ අවසාන දිනය 2026.06.20**

මෙම තරගාවලිය පිළිබඳව ඔබ පීඨයේ සිසුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු. ඊට අදාල ප්‍රචාරක දැන්වීම මේ සමග ඇත.

මේ පිළිබඳව ඔබතුමා/තුමිය දක්වන උනන්දුව සහ සහාය වෙසෙසින්ම අගයමු.

ස්තුතියි!

මෙයට විශ්වාසී

| | | |
|---|---|---|
| බර්නාඩ් කාරියවසම් | රංජිත් විජේනායක | කමල් බී දිසානායක |
| ගරු සභාපති | කලා හා ප්‍රකාශන අනුකමිටු- ගරු සභාපති | ගරු ප්‍රධාන ලේකම් |

පලස
2026



කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සංවිධානය මෙහෙයවන

# කවි, කෙටිකතා සහ කෙටිනාට්‍ය පිටපත් තරගාවලිය

## අන්තර් විශ්වවිද්‍යාල සිසුන් සඳහා

- රාජ්‍ය හෝ පෞද්ගලික ඕනෑම විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවකට මේ සඳහා නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- එක් එක් තරග අංශයට අදාළව නම, ලිපිනය, වයස, ජංගම දුරකථන අංකය, වට්ස්ඇප් අංකය සහ ඊ මේල් ලිපිනය සමග නිර්මාණයේ නම යන තොරතුරු ඇතුළත් ඉල්ලුම් පත්‍රයක් සමග මෙම නිර්මාණය අදාළ ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ ස්වීය නිර්මාණයක් බවට අත්සන යොදා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු බවට අංශ ප්‍රධාන හෝ පීඨාධිපති මුද්‍රාව සහ අත්සන සහිතව සහතික කර එවිය යුතුය.
- එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අංශයකින් එක් නිර්මාණයක් පමණි.
- පැහැදිලි අකුරෙන් ලියා හෝ ටයිප්කර මෙම නිර්මාණය එවිය හැකිය.
- මීට පෙර පලස  හෝ ජාතික මට්ටමේ තරගවලින් ජය ගත් නිර්මාණ නොඑවිය යුතුය.
- කෙටි කතා වචන 1500 නො ඉක්මවිය යුතු අතර කෙටි නාට්‍ය මිනිත්තු 20කට ගැළපෙන සේ සැකසිය යුතුය.
- ඔබගේ නිර්මාණය පිටපත් 3 කින් එවීම අනිවාර්ය වේ. එමෙන්ම අයදුම්පතේ සහ නිර්මාණයේ PDF පිටපතක් uocalumniorg@gmail.com යන විද්‍යුත් ලිපිනයටයොමු කළ යුතුය.
- ජයග්‍රාහී නිර්මාණ සඳහා සහතික, සම්මාන සහ මුදල් ත්‍යාග පිරිනැමෙන අතර, එම නිර්මාණ පළකිරීමටද අපේක්ෂා කෙරේ.
- alumniUOC යූටියුබ් නාලිකාවෙන් නිර්මාණකරණය ගැන දැනුම්වත් විය හැකිය.
- විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණයයි.

**ඔබගේ නිර්මාණ 2026 ජූනි 20 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලිපි කවරයෙහි ඉහළ වම් කෙලවර 'විශ්වවිද්‍යාල අංශය' ලෙස ලියා පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.**

**පලස 2026 තරගාවලිය**
කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සංවිධානය
ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක කාර්යාලය,
කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ 03.

විමසීම් -
කමල් දිසානායක 0714425613 | රංජිත් විජේනායක 0778618273 | බර්නාඩ් කාරියවසම් 0714407230

Fellow us on- www.uocalumni.com  Alumni organization university of colombo  alumniuoc YouTube

කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සංවිධානය
கொழும்புப் பல்கலைக்கழக பழைய மாணவர் சங்கம்
ALUMNI ORGANIZATION UNIVERSITY OF COLOMBO